# බ්‍රිතාන්‍ය ජාතිකයෙකුගේ විමසුම් ඇසට ලක්වූ යටත් විජිත ලංකාව




*ලංකාවේ මහා පාවා දීම ලෙස සැලකෙන උඩරට ගිවිසුම මගින් උඩරට රාජධානිය බ්‍රිතාන්‍යයට ලියා පවරා දීම සිදුවී වසර 191 ක් ගත වී ඇති මේ මොහොතේ 19 වන සියවසේ ලංකාවේ පැවති සංස්කෘතික පසුබිම බ්‍රිතාන්‍ය ජාතිකයෙකුගේ ඇසට ලක්වී ඇති අයුරු විමසා බැලීමේ යම් වැදගත් කමක් ඇතැයි සිතමු.*

*අප මේ කොටස් වශයෙන් ඔබ වෙත ගෙන එන්නේ 1892 දී ලියා පල කරන ලද ඇලන් වෝල්ටර්ස් ගේ පාම්ස් ඇන්ඩ් පර්ල්ස් නම් වූ කෘතිය ඇසුරෙන් සකස් කළ ලිපි පෙළකි.*

එකල නිවාස 11,000ක් තිබී ඇත". අවුරුදු 2000කට පෙර පැවති නගරය උයන් සහ පොදු නාන තටාක වලින් අලංකාරවත් විය. මාවත් ඔස්සේ රාජකීය සහ ආගමික පෙරහැරවල් ප්‍රදේශයම ඒකාලෝක කරමින් ගමනේ යෙදුණි. මාහැඟි කඩ සාප්පු, ජනාකීර්ණ එළිමහන් වෙළඳපොල, නැටුම් හා සංගීත මණ්ඩප, ලැගුම් හල්, දාන ශාලා, මිනිසුන් හා සතුන් වෙනුවෙන් තැනූ ආරොග්‍යශාලා, ආදී බොහෝ දෙයින් නගරය පිරී පැවතුණි. අද දක්නට ලැබෙන ජන ශූන්‍ය මාවත් දෙස බලද්දී එවැනි දසුනක් සිතේ

## තල්, පොල් සහ මුතු පබා - 13

විහාරය ඉතා චාම් එකක් වුවද එහි ඉතා අනර්ඝ වූ පෞරාණික කැටයම් කිහිපයක් තිබුණි. විශේෂයෙන්ම එහි එළිපත්තේ දක්නට ලැබුණු නෙළුම් මල් සහ විවිධ සත්ව රූප වලින් සමන්විත කැටයමෙහි කඟවේනෙකුගේ රුවක්ද ඇතුලත්ව තිබීම අප පුදුමයට පත් කරවීය. සරල ලෙස කැටයම් කර තිබුණු සත්වයා හිස, ශරීරය, අශ්වයෙකුගේ හා සමාන ගාත්‍රා සහ ඇත් දළ වැනි අං තට්ටුවකින් යුතුව නිර්මාණය කර තිබුණි. යම් කලකට පෙර කඟවේනා සාමාන්‍ය ජීවිතයේ බහුලව දක්නට ලැබුණු සතෙකැයි ස්වදෙශිකයින් තහවුරු කර සිටිතත් කඟවේනාගෙන් ඉතිරි වූ සාධක කිසිවක් මෙතෙක් හමු වී නොමැත. නමුත් මෙම කැටයම යම්තාක් දුරට කුතුහලය දනවන සුළුය. මක් නිසාද යත්, නූතන ලෝකයේ විශිෂ්ට ගණයේ මනෝ මූලික සත්වයෙකු ලෙස සලකන සිවුපාවෙකු ආදි වාසී කැටයම්කරුවන්ගේ මනසෙහි ද ඒ හා සමාන ස්වරූපයකින් නිර්මාණය වී තිබී ඇති හෙයිනි. මෙහි ඇති නුවරවල් ඉතා විසිතුරු ලෙස අලංකාර කර පැවති ඒවාය. විසිතුරු කුඩා කණු යොදා තැනූ ගරාදි, පේකඩ කැටයම්, ලියකම්, සහ එංගලන්ත රාජකීය සභා ලාංඡනයේ දක්නට ලැබෙන සතුන්ට වඩා මිත්‍යාවෙන් අඩු සතුන්ගේ රූප වලින් සරසා ඇත. පාත්තයාගේ රූ සටහනට සැලකිය යුතු ස්ථානයක් ලැබී ඇත. සියළුම බෞද්ධ ස්මාරකයන්හි එය ඇතුලත් කර තිබීමෙන් සෑම රටකම මිනිසුන් අතර උසස්තම ගෞරවය මෙම පක්ෂියාට හිමිව ඇත. ඉපැරණි ඊජිප්තුවේ භාවිතා කලාක් මෙන් අදටත් එය බුරුමයේ ජාතික කොඩියේ සංකේතයයි. (ලොව පැරණිම දිය සායම් චිත්‍රය ලෙස සැලකෙන මෙයි-ඩෝම් හි තිබී හමුවූ තණ බුදින පාත්තයාගේ පින්තූරය දැන් ඊජිප්තුවේ ගිසේ කෞතුකාගාරයේ තබා ඇත.) ජූලියස් සීසර්ට අනුව එක්තරා කාලයක බ්‍රිතාන්‍යය තුල පාත්තයින්ගේ මස් අනුභව කිරීම පාපී ක්‍රියාවක් ලෙස සලකනු ලැබ ඇත. ඒ හා සමාන අදහස් ලෝකයේ වෙනත් බොහෝ රටවලින්ද තිබී ඇතැයි සොයා ගැනීමට පුළුවන.

සෞභාග්‍යමත් අනුරාධපුර නගරයේ ප්‍රතිරූපය ඉතා සුවිශේෂී ශෛලියකින් නිමවා තිබේ. එය කොයි ආකාරයකින් හෝ නූතන ස්වදේශිකයින්ගේ නුපුහුණු වැඩ හා සැසඳිය නොහැකිය. කෞතුකාගාරයකදී එම විශිෂ්ට නිර්මාණ දකින ඔබ, ඒවා ග්‍රීක කැටයම්කරුවන්ගේ ඒවා යයි පහසුවෙන්ම රැවටෙනු ඇත. පඩිපෙලක් පාමුල අර්ධ කවාකාර ගල් පතුරක කැටයම් කල ලියවැලක් දුටු විටද ඔබට එසේම සිතෙනු ඇත. එවන් විශිෂ්ට නිර්මාණ කිරීමට නම් වස්තු සම්පත් හා කලා රසඥතාවය නොමඳව තිබිය යුතුය.

පැරණි අනුරාධපුර නගරයේ ප්‍රධාන මාවත දෙපස




**ශ්‍රියා කුමාරසිංහ** නවසීලන්තයේ සිට

මවා ගැනීම ඉතා අසීරු කාරියකි. නූතන දේශීය ලේඛකයෙකු එම පසුබිම මෙසේ විස්තර කරයි.

විහාර මන්දිර වල හා රජ මැදුරුවල කොත් අහස් ගැබ සිසාරා බබලයි. මංමාවත් දිගට ආරුක්කු රාශියකි. මාර්ගයේ දෙපස කළු වැලිද, මැද සුදු වැලිද අතුරා ඇත. දෙපස සැදි මල් බඳුන් මලින් ගැවසී ඇත. වීදි ලාම්පු රෑ දැවීම සඳහා තැනින් තැන සිටවූ ප්‍රතිමාය. නගර ආරක්ෂක කටයුතු සඳහා දුනු ඊතල වලින් සන්නද්ධ මිනිසුන් සමූහයකි. එම සන්නද්ධ මිනිසුන් අතර දැවැන්ත රූපකායෙන් යුත් විශාල අසිපත් රැ ගත් මිනිසුන්ද රාශියක් වෙති. දෙවියන් හා සමාන පෙනුමින් යුත් එම මිනිසුන්ගේ කාය බල ශක්තිය අති මහත්ය. ඒ කෙතරම්ද යත් ඔවුන් අත රැ ඳි බලවත් ආයුධයෙන් අලියෙකුගේ ශරීරය දෙපළු කල හැකිය. දස දහස් සංඛ්‍යාත ජනී ජනයා, අලි ඇතුන්, අශ්වයින්, ගවයින් බැඳි කරත්ත, දෝලාවන්, තිරික්කල, නිරන්තරයෙන් එහා මෙහා යති. නොයෙකුත් රාජකාරී සඳහා වූ මේ මහත් කලබැගෑනිය අතර ශාස්ත්‍රකරුවන්,

නැට්ටුවන්, සහ හක්ගෙඩි, දවුල් බෙර ආදිය රැගත් රන්පැහැ වස්ත්‍රයෙන් සැරසුණු, ඈත එපිට රටවලින් පැමිණි සංගීතඥයින් වැනි අන්‍යයන් සතුටුකිරීම සිය රාජකාරීය කරගත් අයද සිටිති. නගරයේ මහා දොරටු සම්පූර්ණයෙන්ම දෙපසට විවෘතව ඇත. ප්‍රධාන දොරටුවේ සිට දකුණු දිග දොරටුව අතර දුර ගවු හතරකි (සැතපුම් 16කි). දකුණු දිග දොරටුවේ සිට උතුරු දිග දොරටුව තෙක්ද තවත් ගවු හතරක් නොවේද? නගරයේ ප්‍රධාන මාවත් තුනකි. ඒවා නම් වශයෙන් ගත් කල මහා රාජ මාවත, මහා ගංගා මාවත, සහ සඳ මාවත නම් වෙති. මෙහි පසුව සඳහන් කල මාවතෙහි නිවාස සංඛ්‍යාව දස දහසකට වැඩිය. ඉන් බොහොමයක් සෑහෙන ප්‍රමාණයේ විශාල ඒවාය. මෙම විශාල නගරයේ ඇති, ප්‍රමාණයෙන් කුඩා අනෙකුත් මංමාවත් සංඛ්‍යාව අසීමිතය. රජ මාලිගය දැවැන්ත ප්‍රාසාදයකි. එයට යා කොට ඇති ගොඩනැගිලි ගණන අති විශාලය. ඉන් සමහරක් තට්ටු දෙකක් හෝ තුනක් උසට තනා ඇත. පොලව යට ඇති කාමර දිගින් දිගටම විහිදේ. ඒවා "කොපමණ භූමි ප්‍රදේශයක් පුරා පැතිරී ඇද්දැයි කාට නම් කිව හැකිද?

ගරු කටයුතු ජී ටර්නර් මැතිතුමා විසින් මහා වංශයේ සිය පරිවර්තනය තුලින් ක්‍රිස්තු පූර්ව 307දී දෙවනි පිය තිස්ස රජු විසින් අනුරාධපුරයේ තනවා පූජා කරන ලද විහාරයක විස්තර මෙසේ ගෙන හැර දක්-වයි.

රජ වාසල විසින් මහා සංඝයා වෙනුවෙන් පූජා කරන්නට අපේක්ෂිත විහාරයේ උද්‍යාන සීමා තීරණය කරනු වස් රජතුමා මහා සංඝයා වහන්සේ බැහැදැක, වැඳ නමස්කාර කලේය. ඉක්බිතිව සංඝයා වහන්සේද කැටුව ගඟේ ඉහල තොටුපොල දක්වා ගියේය. ඒ යන මග දිගට රන් නගුලකින් පොලොව සෑවේය. රාජකීය ඇත් ගාලේ ඉස්තරම් ඇතුන් වන මහාපදුම සහ කුන්ජාරෝ යන ඇතුන්ට සවි කර තිබුණ නගුලේ මිට මහා සංඝයා වහන්සේ සහ සිය රාජකීය හමුදාව සමග පැමිණි රජු විසින් සීමා සළකුණු කරමින් සියතින්ම මෙහෙයවන ලදී. ඉතා අලංකාරවත් ලෙස සරසනු ලැබූ පුෂ්පකරණී පෙරහැරේ ගෙන යන ලදී. මාහැඟි ධජ පතාක වල එල්ලා තිබූ සීනු මිහිරි නදින් හැඬවිණි. සඳුන් කුඩු අවට විසුරුවා හැරිණි. රන් සහ රිදී පටි, දිළිසෙන වීදුරු කැබලි, මල් මාලා, මල් කුඩා වලින් සැරසූ, රඹකැන් තොරණ වලින් උත්සවශ්‍රීය දෙගුණ තෙගුණ කෙරිණ. කාන්තාවෝ කුඩ සහ අනෙකුත් සැරසිලි උසුලා ගෙන සිටියෝය. අධිරාජ්‍යය සතු රණ බලය මනාව ගෙන හැර පාමින් විහිදී ගිය තූර්ය වාදන හඬින් පරිසරයම ඇළලී ගියේය. රජු පිළිගැනීම් වස් හා උත්සවශ්‍රීය එකහෙළා විදිනු වස් සතර දෙසින් ජයගොස නැගුණි. පොලොවට අධිපති මහරජු, ඔහු වටා සිටි ජනයා ලේන්සු වනමින් කරන ඔල්වරසන් හඬ මධ්‍යයේ මෙම මහාර්ඝ දානමය පුණ්‍යකර්මය නිම කිරීමෙහි දිගටම නිරත වුවේය.

5 වන සියවසේ අනුරාධපුරයේ සිටි පාහියන් සිය දෑසින් දුටු බොහෝ විශ්මය දනවන දසුන් අතර, නිල් තිරුවානා ගලින් නිමැවූ අඩි 231/2ක් උසැති, වටිනා මැණික් එබ්බවූ පිළිමයක් දැක ඇත. එහි එක් අතක ඉතා විශාල මුතු ඇටයක් රඳවා තිබුණි. තවත් චීන සංචාරකයෙකු නගරය පිළිබඳ විස්තරයක් කරමින්, එහි විනිසුරුවරුන්, ප්‍රභූන්, විදේශීය

වෙළෙන්දන් වෙසෙන බවත්, මැදුරු ඉතා අලංකාර බවත්, පොදු ගොඩනැගිලිද ඒ හා සමානවම සරසා ඇති බවත්, ධර්ම ශ්‍රවණය සඳහා සෑම තැනකම නිවාස තනවා ඇති බවත් කියයි. තිස් ලක්ෂයක් පමණ වූ ජනගහණයෙන් හාර ලක්ෂ විසි දහසක් දෙනා යුද හේවායන් වූ බව අසන්නට ලැබුණි. අද මෙහි දක්නට ලැබෙන්නේ කුමක්ද? රජයේ නිල නිවසක පෙනුමෙන් බොහෝ සෙයින් දුරස් වූ ගොඩනැගිලි, පූජකවරුන්ගේ නිවාස කිහිපයක්, දිළිඳු බවින් පෙළෙන පොදු වෙළඳ පොල, සහ අතලොස්සක් පමණ වූ පොල් අතු සෙවිලි කල පැල්පත් කිහිපයකි. සිංහයින්ගේ රජදහනේ ශුද්ධ වූ අග නගරය පත්ව ඇත්තේ කෙතරම් දුක්ඛිත තත්වයකටද? මෙම පරිහානියට ප්‍රධාන හේතුව ලෙස පෙනෙන්නට ඇත්තේ වැව් මනා ලෙස නඩත්තු කොට පිරිසිදුව පවත්වා ගෙන යාමට මෙම මිනිසුන් තුල පැවති අකමැත්ත හෝ නොහැකියාවත්, ඒ හේතු කොට ගෙන ප්‍රදේශය සෞඛ්‍යයට හානිකර තත්වයකින් පැවතීමත්, ඉන් බොහො දෙනෙකු මිය ගොස්, ඉතිරි වූ සුළු පිරිස වෙනත් ප්‍රදේශ සොයා යාමත්, ඉතිරි වී තිබුණු නටබුන්ද දෙමළ ආක්‍රමණිකයන් අතින් සම්පූර්ණයෙන්ම විනාශයට පත් වීමත්ය.

ලෝහමය ප්‍රාසාදයට යාර සිය ගණනකට නොදුරින් දැවැන්ත දාගැබ් කිහිපයක්ම පිහිටා ඇත. ප්‍රමාණයෙන් අති විශාල ලෙස ගඩොලින් තැනූ එම දාගැබ් හැඩයෙන් පිරමීඩ සහ පැගෝඩා අතර වූ හැඩයකින් යුතුය. ඒවා අතර ඉතාමත් උත්කෘෂ්ට චෛත්‍යයන් වන්නේ රුවන්වැලි සහ ථූපාරාමයයි. මින් රුවන්වැලි සෑය වාස්තු විද්‍යාත්මකව නිමැවූ දැවැන්ත කන්දකි. අඩි 150ක් උසය. ඉතා ශක්තිමත් ලෙස සැකසූ මළුවක ක්‍රිස්තු පූර්ව 150 දී ගැමුණු රජු විසින් තනවා ක්‍රිස්තු වර්ෂ 243දී සිංහ රජු විසින් අකුණු සැර වලක්වාලනු වස් වීදුරු කොතක් පළඳවනු ලැබීය. ථූපාරාමය ඊට සියවස් හතරකට පෙර පළවෙනි තිස්ස රජු විසින් බුදුන් වහන්සේගේ අකු ධාතුව නිදන් කරනු සඳහා තනවන ලද්දකි. එම දාගැබ වට කොට සිහින් කණු සහ තවත් සැරසිලි සිටුවා අලංකාර කොට ඇත. ඒවා දිස් වන්නේ තරුණ කතකගේ ගෙල වටා රැඳවූ මැණික් පළඳනාවක් මෙනි. තවමත් ඉතිරිව පවත්නා කණු අතර එක පෙළකට කණු 26 ගණනේ පේලි හතරකි. එක කණුවක් අඩි 21ක් උසය. මූලය හතරැ ස්ය. රවුම් කණු වල මුදුන අටපට්ටම් හැඩයෙන් යුතුය. නියනෙන් කල ඉතා සියුම් කැටයම් වලින් හැඩ ගන්වා ඇත. දාගැබ හරි මැද පිහිටන පරිදි විහිදී යන වළල්ලක හැඩයෙන්, කළුගල් වේදිකාවක් මත මේ කණු සිටුවා ඇත.

ක්‍රිස්තු වර්ෂ 310 දී ජේතවනාරාම දාගැබ තැනවූ මොහොතේ එය අඩි 315 ක උසින් යුතු වුවද අද එහි උස අඩි 269කි. ක්‍රිස්තු පූර්ව 87දී වලගම්බාහු රජු විසින් දෙමළුන් පරදා ලැබූ ජයග්‍රහණය සිහි කරනු වස් තැනවූ අභයගිරි දාගැබ මුල් අවස්ථාවේදී උසින් අඩි 405 ක් විය. ( මෙය සාන්ත පාවුළු දේ-වස්ථානය මුදුනේ ඇති කුරුසයේ උසට වඩා අඩි 40ක් උසින් වැඩිය.) කාලයාගේ ඇවෑමෙන් දාගැබේ උස අද අඩි 240 දක්වා අඩුවී ඇත. මෙම දැවැන්ත ආකෘතිය වට ප්‍රමාණයෙන් අඩි 360කට නොඅඩුය. එහි පරිමාව ඝන අඩි ලක්ෂ 200 ඉක්මවයි. එය සෑදීම සඳහා භාවිතා කල අමු ද්‍රව්‍ය යොදා කො-වෙන්ට්‍රි හා සමාන නගරයක් ඉදි කල හැකිය. නැතහොත් ලන්ඩනයේ සිට එඩින්බරෝ නගරය දක්වා අඩියක් පළල, අඩි දහයක් උස ප්‍රාකාරයක් ඉදි කල හැකිය. එවැනි ගොඩනැගිල්ලක් වර්තමානයේ තනන්නේ නම්, මිනිසුන් 500ක් යොදවා අවුරුදු 7ක් ගතවන බවට ඇස්තමේන්තු කර තිබේ. පුරාතන ගඩොල් කර්මාන්තය ඉතා සියුම් හා මනා නිමැවුමකින් යුතුය. එකද ගඩොලක් හෝ ගෙවී ගොස් නැත. හුණු බදාමය තුල පිළිස්සූ සිප්පි කටු වල ශේෂ දැකිය හැකිය. දාගැබ් බිත්තියේ ආලේප කර ඇති හුණු වල කෝණික නම්‍යතාවය හා මටසිලිටු බව අදද එසේම රැ කී ඇත.

දාගැබ් සාමාන්‍යයෙන් අර්ධ ගෝලාකාරය. කෘෂි වගාවන්ට වන සතුරු ආක්‍රමණ වලකාලීමට මෙම හැඩය ඉතා සුදුසුය. පුරාණ මධ්‍යම ඇමෙරිකාවේ විශාල ගොඩනැගිලි හා දාගැබ්වල සමානතාවය පුදුමය දනවන සුළුය. අර්ධ කවාකාර ගොඩනැගිල්ලේ හැඩය සහ ප්‍රමාණය, මුදුනත ඇති කුඩා කුළුණ, සෑම අහුමුල්ලකම බහුලව වැවෙන බවභෝග, සැරසිලි වල ස්වභාවය, පාමුල ඇති කුඩා දොරටුව, මේ සෑම දෙයක්ම සර්ව සම්පූර්ණයෙන් එක හා සමානය. ගැමුණු රජු රුවන්